**අධ්‍යාපන අමාත්‍යාංශයේ - ආගම් හා සාරධර්ම ශාඛාව මගින් මෙහෙයවන**

**නැණ පවුර සිසු සම්මන්ත්‍රණය**

**2022 අ.පො. ස. උසස් පෙළ - පෙරහුරු සම්මන්ත්‍රණය**

**45 - බෞද්ධ ශිෂ්ටාචාරය** **පැය තුනයි**

- **I කොටසින් ප්‍රශ්න දෙකක් ද II කොටසින් ප්‍රශ්න තුනක් ද තොරාගෙන, ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.**
- **සෑම ප්‍රශ්නයකට ම ලකුණු 20 බැගින් හිමි වේ.**

## I කොටස

01 (i) ගෘහස්ථ ආශ්‍රමයට අයත් කාර්යන් දෙකක් නම් කරන්න. (ලකුණු 2)

(ii) යාගයක් අංගසම්පූර්ණවීම සඳහා සපුරාලිය යුතු මූලික අවශ්‍යතා තුනක් පෙන්වා දෙන්න. (ලකුණු 3)

(iii) බ්‍රාහ්මණයන් විසින් කාන්තාව පුරුෂාධිපත්‍යයට නතුකළ අයුරු නිදසුන් හතරක් ඇසුරෙන් ගෙනහැර දක්වන්න. (ලකුණු 4)

(iv) බුද්ධකාලීන භාරතයේ ප්‍රධාන ජීවන ක්‍රම අතර කෘෂිකර්මාන්තය පැවැති බවට සාදක පහක් ඇසුරෙන් පැහැදිලි කරන්න. (ලකුණු 5)

(v) මක්ඛලීගෝසාල ශාස්තෘවරයාගේ ඉගැන්වීම් පෙන්වාදෙමින් එයින් සමාජ සදාචාරයට සිදුවන හානිකර තත්ත්වය පැහැදිලි කරන්න. (ලකුණු 6)

02 (i) බුදුරජාණන් වහන්සේ විජ්ජාචරණ සම්පන්න නමින් හැඳින්වීමට හේතුවූ සාධක දෙකක් නම් කරන්න. (ලකුණු 2)

(ii) බුදුරජාණන් වහන්සේගේ පද්මාකාර ජීවිතය පිළිබිඹුවන අවස්ථා තුනක් පැහැදිලි කරන්න. (ලකුණු 3)

(iii) බුදුරජාණන් වහන්සේගේ මහාකරුණා ගුණය නිදසුන් හතරක් ඇසුරෙන් පැහැදිලි කරන්න. (ලකුණු 4)

(iv) අනේපිඬු සිටුතුමාගේ චරිතයෙන් ගතහැකි ආදර්ශ පහක් පැහැදිලි කරන්න. (ලකුණු 5)

(v) යහපත් රාජ්‍ය පාලන තත්ත්වයක් පවත්වාගෙන යාම සඳහා සප්ත අපරිහාණිය ධර්මවල උපයෝගිතාව සාකච්ඡා කරන්න. (ලකුණු 6)

03 (i) **"නපරේසං විලෝමානි"** යන ධම්මපද ගාථාව නිවැරදිව සම්පූර්ණ කරන්න. (ලකුණු 2)

(ii) එම ගාථාවේ අර්ථය නිවැරදිව ලියන්න. (ලකුණු 3)

(ii) ස්වාමි භාර්යා යුතුකම් හා වගකීම් සිගාලෝවාද සූත්‍රයට අනුව නම් කරන්න. (ලකුණු 4)

(iv) "නිද්දාසීලි සභාසීලි අනුට්ඨාතාච යෝනරෝ " යන ගාථාවේ ඇතුලත් පුද්ගලයෙකු පිරිහීමට හේතුවන කරුණු පැහැදිලි කරන්න. (ලකුණු 5)

(v) ශ්‍රද්ධාව පිළිබඳ බෞද්ධ ආකල්පය හඳුන්වන්න. (ලකුණු 6)

MINISTRY OF EDUCATION

## II කොටස

04 (i) නිදහස් චින්තනය පිළිබඳ බෞද්ධ ඉගැන්වීම සමකාලීන ඉගැන්වීම්වලින් වෙනස් වන ආකාරය නිදසුන් මගින් පැහැදිලි කරන්න. (ලකුණු 10)

(ii) සමාජ හිතකාමී පරිසරයක් බිහිකර ගැනීමට දස පුණ්‍ය ක්‍රියා උපකාර වන ආකාරය විමසීමට ලක් කරන්න. (ලකුණු 10)

05 (i) අල්පේච්ඡතාව සන්තුට්ඨිය හා සුභරතාව යන සංකල්පවල කාලීන වැදගත්කම පිළිබඳ ධර්මානුකූල විවරණයක් කරන්න. (ලකුණු 10)

(ii) බුදුරජාණන් වහන්සේ මෙන්ම ශ්‍රාවකයන් වහන්සේලාද පරිසර සෞන්දර්ය අගයකොට ඇති ආකාරය උදාහරණ ඇසුරෙන් විස්තර කරන්න. (ලකුණු 10)

06 (i) තෙවන ධර්ම සංගායනාවේ ප්‍රතිඵල බුදුදහමේ චිරස්ථිය හා ව්‍යාප්තියට හේතු වූ අයුරු පෙන්වා දෙන්න. (ලකුණු 10)

(ii) භාරතයේ පැවැති ප්‍රකට පැරණි බෞද්ධ විශ්වවිද්‍යාලවලින් සිදුවූ ධර්ම ශාස්ත්‍රීය සේවාව ඇගැයීමට ලක්කරන්න. (ලකුණු 10)

07 (i) අභයගිරි විහාරයේ ප්‍රභවය මෙරට ශාසනික ගැටලු උද්ගතවීමට මෙන්ම සංස්කෘතික ප්‍රවණතාවක් උදාකරලීමට ද හේතුවූ අයුරු විමර්ශනය කරන්න. (ලකුණු 10)

(ii) ථායි ජන ජීවිතය පෝෂණය කිරීමෙහිලා බුදුදහමෙන් ලද ආභාසය පැහැදිලි කරන්න. (ලකුණු 10)

08 (i) බුද්ධ ප්‍රතිමාවේ ආරම්භය සැකෙවින් දක්වා ගන්ධාර හා මථුරා සම්ප්‍රදායන්හි වෙනස්කම් පැහැදිලි කරන්න. (ලකුණු 10)

(ii) සිංහල ජනකවියේ පෝෂණයට බුදුදහමෙන් ලැබුණු ආභාසය උදාහරණ සහිතව විස්තර කරන්න. (ලකුණු 10)

**සැකසීම :** කථිකාචාර්ය පූජ්‍ය මැටිබැඹියේ ධම්මසිරි හිමි
අධ්‍යාපනපති පූජ්‍ය උලහිටියාවේ විභාවි හිමි
ශාස්ත්‍රවේදී පූජ්‍ය කුඹුක්ගොල්ලෑවේ සුමනසාර හිමි
කථිකාචාර්ය ආර්.ඩී. ශ්‍රියානි හේමලතා මිය
ගුරු උපදේශක ආර්.ඒ. ගුණවර්ධන මයා

MINISTRY OF EDUCATION